# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,704—1941ක්වූ ජනවාරි මස 24 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 2,243 (මාතලේ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1941ක්වූ ජනවාරි මස 24වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජසන්තක ඉඩම්යැයි ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශ කරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒවා කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4 වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1940ක්වූ දෙසැම්බර් මස 20වෙනි දින මාතලේ කච්චේරියේදීය.

ආර්. එච්. ඩී. මැන්ඩර්ස්,
ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙනුව.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ පිඹුරු සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු කොට්ඨාසයේ වගපනහ පල්ලේසියපත්තුවේ කලුන්දෑව යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කැබිලි, එනම්:—

මුල් පිඹුරේ නො. A 609.

| බිම්කැබිල්ල. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|
| 1 | කපුවත්ත | .. .. | 0 | 0 | 30·6 |
| 2 | ඉවුරපිටගෙත්ත | .. .. | 0 | 1 | 14·3 |
| 3 | ඉවුරපිටගෙත්ත (ගන්සභාපාරදිගේ වෙන්කර තිබෙන බිම) | .. .. | 0 | 0 | 6·5 |
| 4 | කපුවත්ත | .. .. | 0 | 1 | 7·2 |
| 5 | කපුවත්ත (ගන්සභාපාරදිගේ වෙන්කර තිබෙන බිම) | .. .. | 0 | 0 | 8·4 |
| | | | 0 | 3 | 27 |

මීට මායිම්—උතුරට පී. බිංගිරිබණ්ඩා සහ තවත් අයවලුන් විසින් අයිතිවාසිකම්කියන ඉවුරපිටගෙත්තද; නැගෙනහිරට කෝන්ගහවෙල සිට ඇරැල්ලට යන ගන්සභාපාරද; දකුණට කපුවත්ත නො. A 514 දරණ මුල් පිඹුරේ 2වෙනි සහ 1වෙනි බිම්කැබිලි (ආණ්ඩුවේ) ද; බස්නාහිරට කේ. උක්කුබණ්ඩා සහ තවත් අයවලුන් විසින් අයිතිවාසිකම්කියන කපුවත්ත සහ පී. බිංගිරිබණ්ඩා සහ තවත් අයවලුන් විසින් අයිතිවාසිකම්කියන ඉවුරපිටගෙත්තද වෙත්.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Puttalam No. 88.—පුත්තලම්-හලාවත දෙදිසාවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1941ක්වූ මාර්තු මස 8වෙනි දිනවූ සෙනසුරාදා පූ. භා. 10ට පුත්තලම් කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ කබ්රැච්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් නිස්දූකරන් යෙදෙනවා ඇත. පුත්තලම් දිසාවේ උතුරු බස්නාහිර පලාතේ දෙමලහත්පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබෙලි තුනක්.

මුල් පිඹුරේ නො. 5,311. ගම—පුදුවෙල්ලිය. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | | ඉල්ලුම්කාරයා. | අන්දම. | | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මඩාමෙල්කට්ටිය | .. | වඩක්කේ පදිංචි (1) මුදලිහාමිගේ උක්කිරාල, (2) එම අප්පුහාමි, (3) කවිරාලගේ වන්නිඑතනා, (4) එම පිංහාමි, (5) එම රන්මැණිකා සහ (6) හේරත්හාමිගේ පුංචිබණ්ඩා | අකුල් කැපීය | .. | 2 3 18 | 20* |

මුල් සිතියමේ නො. A 564. ගම—වඩත්ත.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ.රූ.ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | මඩමේමෙල .. | වඩත්තේ පදිංචි (1) මුදලිහාමිගේ උක්කිරල, කුඹුර (2) එම අප්පුහාමි, (3) කවිරලගේ වන්නිඅතනා, (4) එම පිංහාමි, (5) එම රත්මැණිකා සහ (6) හේරත්හාමිගේ පුංචිබණ්ඩා | .. කුඹුර | .. 1 1 34 | 20* |
| 2 | වඩත්තහේන්යාය .. | එම .. | .. හේන | .. 0 2 24 | 20* |

* ඉඩම් විකිණීමේ හා බදුදීමේ නො. 37 දරණ ආඥාපණත යටතේ විකිණීම පිණිස.

මෙම ඉඩම් පිළිබද වැඩිදුර කරුණු පුත්තලම් කච්චේරියේ උප ඒජන්තතුමාගෙන්ද, එම ඉඩම්වල සිතියම් කොළඹ සිවිල පිටපත් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැක.

මේ 1941ක්වූ ජනවාරි මස 22වෙනි දින කොළඹ ඉඩම් පිළිබද කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරස්වාමි,
ඉඩම් පිළිබද කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ සාවශ්‍යත්සකට, එනම් :—බෙලිඅත්ත-හංගල්ලේපාර හා සන්දිවනතැන, පලපොත පුවක්දන්ඩාවේ රෝඩ් කොමිටි පාර පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට තිසිඅකාර මට අණ ලැබී ඇත්තේ, ඒ ඉඩම්නම් :—

අවසාන ගම් සිතියමේ නො. 308, අතුරු සිතියමේ නො. 14. ගම—පුවක්දන්ඩාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 237 | අම්පිටියවැව ගාව වත්ත | මුඩුබිම .. .. | පුවක්දන්ඩාවේ පදිංචි කන්කානන්පතිරනගේ දෙදුන් මර්තේනිස්, කන්කානන්පතිරනගේ දෙදුන් නිකුලස් සහ සෙන්කොන්දඅරච්චිගේ ලොකුහාමි සහ බෙලිඅත්තේ පදිංචි කලු හෙන්නැදිගේ අප්පුසිංඤො | 0 0 1·55 |
| 238 | තෙලඹුගහහේන .. | අවුරුදු 3 වයස ඇති කොස්ගස් 3ක්ද, අවුරුදු 2 වයස ඇති පොල්පැල 1ක්ද, අවුරුදු 30 වයස ඇති ඉඹුල් ගස් 1ක් සහිත වත්ත | කිරිඇල්ලේ පදිංචි ගාර්දියේපුන්චිහේවාගේ ජීරිස් සිල්වා | 0 0 4·04 |
| 239 | අම්පිටියවැව ගාව වත්ත | අවුරුදු 2 වයස ඇති පොල්පැල 3ක්ද, අවුරුදු 15 වයස ඇති බෙලිගස් 1ක්ද, අවුරුදු 12 වයස ඇති පොල් ගස් 2ක්ද, අවුරුදු 4 වයස ඇති පොල්පැල 1ක්ද සහිත වත්ත | පුවක්දන්ඩාවේ පදිංචි කන්කානන්පතිරනගේ දෙදුන් මර්තේනිස්, කන්කානන්පතිරනගේ දෙදුන් නිකුලස් සහ සෙන්කොන්දඅරච්චිගේ ලොකුහාමි සහ බෙලිඅත්තේ පදිංචි කලු හෙන්නැදිගේ අප්පුසිංඤො | 0 0 3·68 |
| 240 | තෙලඹුගහහේන .. | වැවිල්ලක් නැති වත්ත .. | කිරිඇල්ලේ පදිංචි ගාර්දියේපුන්චිහේවාගේ ජීරිස් සිල්වා | 0 0 0·37 |
| 241 | ගල්බොඩහේන . | එම .. .. | එම .. .. | 0 0 1·85 |
| 242 | අම්පිටියවැව ගාව වත්ත | එම .. .. | පුවක්දන්ඩාවේ පදිංචි කන්කානන්පතිරනගේ දෙදුන් මර්තේනිස්, කන්කානන්පතිරනගේ දෙදුන් නිකුලස් සහ සෙන්කොන්දඅරච්චිගේ ලොකුහාමි සහ බෙලිඅත්තේ පදිංචි කලු හෙන්නැදිගේ අප්පුසිංඤො | 0 0 0·21 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාවේ තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1941ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පස්වරු 2.30ට කෑගල්ල කච්චේරියේ ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ ගොඩසී අන්දමේ අයිතිවාසිකම්ද කියා කිසි විරුද්ධත්වයක් ඇත්නම් ඒ ගැනද මේ ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1941ක්වූ ජනවාරි මස 17වෙනි දින සබරගමුවට කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

ආණ්ඩුවේ සාවශ්‍යත්සකට, එනම් :—අවසාන ගම් සිතියමේ නො. 567 ලොට් 40L දරණ ඉඩමේ පාරට බිම්තීරුවක් වෙන් කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට තිසිඅකාර මට අණ ලැබී ඇත්තේ, ඒ ඉඩම නම් :—

අවසාන ගම් සිතියමේ නො. 567. අතුරු සිතියමේ නො. 2. ගම—මහබෝලාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 17 | මහබෝලානකැලේ .. | පොල්අතු සෙවිලිකරනලද තාවකාලික ගෙයක් සහිත කුඹුර | කඳුරුපොකුණේ පදිංචි හතරසිංහආරච්චිගේ හිංගිඅප්පුහාමි | 0 2 32 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාවේ තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1941ක්වූ පෙබරවාරි මස 25වෙනි දින පස්වරු 2.30ට කෑගල්ල අම්බලන්ගොඩ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ ගොඩසී අන්දමේ අයිතිවාසිකම්ද කියා විරුද්ධත්වයක් ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1941ක්වූ ජනවාරි මස 17වෙනි දින සබරගමුවට කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

මේ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපනතේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ සාවශ්‍යත්සකට, එනම් :—ගැටිවුවාගෙත්ඇලේ අමුන බැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "මේ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මණ්ඩලයට උතුමාණන් වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට තිසිඅකාර මට බලය ලැබී ඇත්තේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. A. 681. ගම—මරලුවාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 2 | ඇල්ගෙත්පිටිය | මුඩුබිම .. | රනවන පී. බී. මහවෙ නිලමේ .. | .. 0 1 29·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වම් 1941ක්වූ මාර්තු මස 3වෙනි දින පෙරවරු 10ගේ කාලයට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1941ක්වූ ජනවාරි මස 18වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇම්. ශ්‍රීකාන්තා,
ආණ්ඩුවේ උප ඒජන්ත වමිය.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි අඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගම්සභා පාරක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වම් 1876ගේ ඉඩම් ලබාගැනීමේ අඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මණ්ඩලයට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට කීසිඅකාර මට බලය ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 664. ගම—සේරුගොල්ල.

| නො. | ඉඩමේ නාම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මහවත්ත හොහොත් සේරුගොල්ලේ වත්ත, හිටිනාවත්ත | වත්ත .. | සේරුගොල්ලේ වී. එච්. කිරු හේනයා .. | 0 0 35·2 |
| 2 | — .. | ගම්සභාපාර .. | (1) ඩබ්ලිව්. පොඩියා, (2) ඩබ්ලිව්. මත්තියා, (3) ඩබ්ලිව්. ගින්නෝරියා, (4) ඩබ්ලිව්. සයිඳුම්මා, (5) ඩබ්ලිව්. පොඩිඅම්මා | 0 0 14·7 |
| 3 | — .. | එම .. | සේරුගොල්ලේ කේ. බබාහාමි .. | 0 0 11·4 |
| 4 | — .. | එම .. | එම ඩබ්ලිව්. රංහාමි .. .. | 0 0 2·5 |
| 5 | — .. | එම .. | එම කේ. බබාහාමි .. .. | 0 0 5·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1941ක්වූ මාර්තු මස 4වෙනි දින පෙරවරු 10ගේ කාලයට වදකඩ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1941ක්වූ ජනවාරි මස 18වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇම්. ශ්‍රීකාන්තා,
ආණ්ඩුවේ උප ඒජන්ත වමිය.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි අඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—ගම්සභා පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වම් 1876ගේ ඉඩම් ලබාගැනීමේ අඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මණ්ඩලයට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට කීසිඅකාර මට බලය තිබේ, ඒ ඉඩම්නම්:—

අවසාන ගම් සිතියමේ නො. 1,541. අතුරු සිතියමේ නො. 1. ගම—මඟුරත්කඩවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 46 | මාගරච්චත්ත .. | පොල්වත්ත .. | එෆ්. ජේ. එම්. ද මෑල් .. .. | 4 1 24·3 |
| 47 | මිහවැවගාවාකැලේ .. | මුකලාන .. | එම .. .. .. | 0 0 8·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1941ක්වූ මාර්තු මස 6වෙනි දින පෙරවරු 10ගේ කාලයට නිකවැරටියේ නානායක්කාරගේ කචේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1941ක්වූ ජනවාරි මස 18වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇම්. ශ්‍රීකාන්තා,
ආණ්ඩුවේ උප ඒජන්ත වමිය.

---

## ඉඩම සශ්‍රීකකිරීමේ දැන්වීම.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස ගාල්ලේ කච්චේරියේදී වම් 1941ක්වූ පෙබරවාරි මස 8වෙනි දින පූ. භා 10ට 1935ගේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ අඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් ගාල්ලේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කෑල්ලක් ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇත හොත් එය දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

4. මේ ඉඩම්වල සිතියම් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානතුමාගෙන් සුළු මුදලක් ගෙවීමෙන් ලබාගත හැක.

වී. කුමාරසවාමි,
ඉඩම් කොමසාරිස්තුමා.

වම් 1941ක්වූ ජනවාරි මස 17වෙනි දින ඉඩම් කොමසාරිසතුමාගේ කන්තෝරුවේදීය.

## දීමට යන ඉඩමේ විස්තර.

ප්ලෑනේ අංකය 14,025. ගම—සිපත්වත්ත.

| කෑබෙල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 2 දියරඳුව .. | පටබැදිමුල්ලේ පදිංචි ජේ. බී. ප්‍රනාන්දු | 2 2 7 |

---

## ලංකා සේවිංස් බැංකුවේ පොලී පිළිබඳ දැන්වීම.

සිලෝන් සේවිංස් බැංකුවේ මුදල් තැන්පත්කරන්නන්ට 3වෙනි නියෝගය යටතේ 1941 අවුරුද්දට ගෙවියයුතු පොලියේ ප්‍රමාණය සියයට 3ක් බව එම බැංකුවේ ඩිරෙක්ටර්වරුන් විසින් දන්වා සිටිනු ලැබේ.

එච්. ඒ. හාමර්,
ලේකම්තැන.

වම් 1941ක්වූ ජනවාරි මස 16වෙනි දින කොළඹ සිලෝන් සේවිංස් බැංකුවේදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.